# අග්‍රාමාත්‍ය කාර්යාලය

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම (වාහන අලුත්වැඩියා කටයුතු) 2026 වර්ෂය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2026 වර්ෂය සඳහා වාහන අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා 2025.12.05 දින ප.ව. 2.00 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. 2026 වර්ෂය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ වාහන අලුත්වැඩියා කටයුතු සිදු කරන සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා ගාස්තුව වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 2,500.00 ක මුදලක් **"අග්‍රාමාත්‍ය ලේකම්"** නමින් ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ අංක 7040019 දරන ගිණුමට බැර වන ලෙස ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් මුදල් ගෙවීම් කර, ඒ සඳහා බැංකුව විසින් ලබාදෙන ලදුපතේ මුල් පිටපත අයදුම්පත සමග 2025.12.05 දින ප.ව. 2.00 ට පෙර **අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය, නො. 58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. ලියාපදිංචිය සඳහා අයදුම්පත සහ ඊට අදාළ උපදෙස් හා කොන්දේසි අග්‍රාමාත්‍ය කාර්යාලයීය නිල වෙබ් අඩවියෙන් (https://www.pmoffice.gov.lk), මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විද්‍යුත් ප්‍රසම්පාදන වෙබ් අඩවියෙන් (https://www.promise.lk), හෝ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ගිණුම් අංශය වෙතින් ලබාගත හැක.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම (වාහන අලුත්වැඩියා කටයුතු)"** යනුවෙන් සඳහන් කළ යුතුය.

වැඩි විස්තර දුරකථන අංක 0112576073 මගින් විමසීම් කළ හැක.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**අග්‍රාමාත්‍ය කාර්යාලය, කොළඹ 07.**

**2026 වර්ෂය සඳහා වාහන අලුත්වැඩියා කටයුතු සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය**
**අග්‍රාමාත්‍ය කාර්යාලය, කොළඹ 07**

1. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය සහ දිනය :- (ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය) ……………………………………………………

2. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පරිදි ආයතනයේ නම :-………………………….……......
.........................................................................................................................................

3. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පරිදි ආයතනයේ ලිපිනය :-……………………..………
……………………………………………………………………………………………....

4. ව්‍යාපාර හිමිකරුගේ / හිමිකරුවන්ගේ (සමාගමක් නම් අධිකාරියලත් අයගේ නම්) නම/නම් :-
……………………………………………………………………………………..……..

5. ව්‍යාපාර හිමිකරුගේ (තනි පුද්ගල ව්‍යාපාරයක් නම්) ඔහුගේ / ඇයගේ පුද්ගලික ලිපිනය :-
………………………………………………………………………………………..…..

6. ආයතනයේ ස්ථාවර දුරකථන අංකය :- ………………........ෆැක්ස් අංකය :- …………..………...

7. ජංගම දුරකථන අංකය :-……………………………………………………………..….……

8. විද්‍යුත් තැපැල් ලිපිනය (සක්‍රීයව භාවිත කරන) :-…………………………………………………

9. (අ) පහත වාහන වර්ගීකරණය අනුව වාහන අලුත්වැඩියාවන් සඳහා පහසුකම් ඇත්ද යන වග,

| | | |
|---|---|---|
| I. | Defender Jeep | ☐ |
| II. | Double Cab / Van | ☐ |
| III. | Bus /Lorry | ☐ |
| IV. | BMW /Benz / Audi / Land Rover//Discovery (Europe Vehicles) | ☐ |
| V. | Nissan / Toyota Car | ☐ |
| VI. | Toyota Land Cruiser Jeep / Prado/ Ford | ☐ |
| VII. | Three Wheelers | ☐ |
| VII. | Motor Cycles | ☐ |

(ආ) පහත අලුත්වැඩියාවන් ඉටු කිරීමට හැකියාව ඇත්ද යන වග,

| | | |
|---|---|---|
| I. | එන්ජින් / ගියර් පද්ධති අලුත්වැඩියාවන් | ☐ |
| II. | ඩීසල් පොම්ප අලුත්වැඩියාවන් | ☐ |
| III. | වාහන වායු සමීකරණ අලුත්වැඩියා කිරීම සහ සේවා කිරීම | ☐ |
| IV. | වාහන ටින්කරින් , පින්තාරු , Chassis ඇද ඇරීම සඳහා පහසුකම් තිබේද යන්න | ☐ |
| V. | වාහන කුෂන් වැඩ, අපෝස්ටින් වැඩ ,කැනපි අලුත්වැඩියාව සහ කාපට් යෙදීම | ☐ |
| VI. | වාහන ඉලෙක්ට්‍රොනික් පද්ධති සහ විදුලි කාර්මික කටයුතු | ☐ |
| VII. | Reverse camera, Cassette Recorder | ☐ |
| VIII. | ස්ටිකර්, ටින්ටඩ් සහ නවීකරණය කිරීම | ☐ |
| IX. | වාහන හදිසි අනතුරු අලුත්වැඩියාවන් සිදුකරන්නේද යන්න | ☐ |
| X. | යෝග්‍යතා සහතික, වාහනවල තත්ව වාර්තා සහ තක්සේරු වාර්තා සැපයීම | ☐ |
| XI. | වාහන අභ්‍යන්තර පිරිසිදු කිරීමේ කටයුතු සහ Cut & Polish කිරීම | ☐ |
| XII. | Windscreen /Head Light polish කිරීම | ☐ |
| XIII. | වාහන ආරක්ෂිතව ගාල් කර තැබීමට පහසුකම් තිබේ ද යන්න | ☐ |

10 ඔබ ආයතනයෙන් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලබාදිය හැකි උපරිම ණය සීමාව :- රු……………..

11 VAT බදු ගෙවන්නේ නම් අංකය :- ……………………………………………………………………

12 ඉහත අයදුම් කරන සේවා අයිතමයන් සැපයීම සඳහා ලියාපදිංචි ගාස්තුව වශයෙන් ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ 7040019 දරණ ගිණුම් අංකය සඳහා රු.2,500/- (රුපියල් දෙදහස් පන්සීය ) ක මුදලක් ......................... දින බැර කරන ලදී. (ලදුපතේ මුල් පිටපත අමුණා ඇත)

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් ප්‍රකාශ කරන අතර, අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා 2026 වර්ෂයට අදාල වාහන අලුත්වැඩියා කටයුතු සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් නියම කර ඇති ඇමුණුම 01 හි සඳහන් කොන්දේසි වලට එකඟ වන බව ද මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :- …............................

.........................................
අයදුම්කරුගේ අත්සන
(ආයතනයේ නිල මුද්‍රාව)

## <u>අයදුම්පත් සම්පූර්ණ කිරීම සහ ගාස්තු ගෙවීම</u>

1. අයදුම්පත මිලිමීටර් 210x297 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, අංක 01 සිට 09 තෙක් ශීර්ෂ පළමු පිටුවේද, ඉතිරි ශීර්ෂ දෙවන පිටුවේ ද සටහන් වන පරිදි සකස් කළ යුතුය. එම තොරතුරු ඉදිරිපත් කිරීමේදී ව්‍යාපාර ලිපි ශීර්ෂය යටතේ ඉදිරිපත් කළ යුතුයි. එම ආකෘතිය අග්‍රාමාත්‍ය කාර්යාලයීය නිල වෙබ් අඩවියෙන් (https://www.pmoffice.gov.lk) ,මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විද්‍යුත් ප්‍රසම්පාදන වෙබ් අඩවියෙන් (https://www.promise.lk) හෝ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ගිණුම් අංශය වෙතින් 2025.12.05 දින ප.ව.2.00 දක්වා ලබාගත හැක.

2. 2026 වර්ෂය සඳහා මෙම කාර්යාලයේ සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වීමට, ලියාපදිංචි ගාස්තුව වශයෙන් ආපසු නොගෙවනු ලබන රු.2,500/- (දෙදහස් පන්සීය) ක මුදලක් ගෙවිය යුතුවේ.

3. ලියාපදිංචි ගාස්තු "අග්‍රාමාත්‍ය ලේකම්" නමින් ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ අංක 7040019 දරණ ගිණුමට බැර වන ලෙස ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් මුදල් ගෙවීම් කළ හැක. එම ගෙවීම් සිදුකළ බව සනාථ කරගැනීම සඳහා බැංකුව විසින් ලබාදෙන ලදුපතේ මුල් පිටපත අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. එහිදී ලියාපදිංචි වන ආයතනයේ නමින් මුදල් තැන්පත් කළ යුතු අතර, ආයතනයේ නම ලදුපතේ සඳහන් වී තිබිය යුතුය. ලියාපදිංචිය සඳහා නියමිත පරිදි ලියවිලි ඉදිරිපත් කර නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලියාපදිංචි ගාස්තුව නැවත නොගෙවනු ලැබේ.

4. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, ඉල්ලුම් කර ඇති අනෙකුත් ලියවිලි ද සමඟ 2025.12.05 දින ප.ව 2.00 හෝ ඊට පෙර අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය, නො.58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය.(තැපැලේදී සිදුවන ප්‍රමාදයන් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් භාර ගනු නොලැබේ.) නියමිත වේලාව අවසන් වූ විගස ඉල්ලුම්පත් විවෘත කිරීමේ කටයුතු සිදුකරනු ලැබේ.

5. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම (වාහන අලුත්වැඩියා කටයුතු) " යනුවෙන් සඳහන් කළ යුතුය.

6. වැඩිදුර විමසීම් දුරකථන අංක 011 257 6073 මඟින් සිදුකළ හැක.

**සභාපති**
ප්‍රසම්පාදන කමිටුව
අග්‍රාමාත්‍ය කාර්යාලය
කොළඹ 07

ඇමුණුම 01

**කොන්දේසි**

1. අයදුම්පත්‍රයේ සඳහන් සේවා සැපයීම සඳහා ලියාපදිංචි කරන ලද ව්‍යාපාරයක් වීම.
2. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගරාජයක් වීම අමතර සුදුසුකමක් වීම.
3. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සලකා බලා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකිරීමෙන් පසු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි කිරීම. (ඇමුණුම 02 පරිදි )
4. ලියාපදිංචිය සඳහා ව්‍යාජ ලියවිලි ඉදිරිපත් කරන අයදුම්කරුවන් සම්බන්ධයෙන් දැඩි නීතිමය පියවර ගැනීම.
5. වාහන ලියාපදිංචිය සඳහා අයදුම් කරන සියලු ආයතන, අග්‍රාමාත්‍ය කාර්යාල පරිශ්‍රයේ සිට 15 km පමණ වන සීමාව තුල පිහිටා තිබීම.
6. අග්‍රාමාත්‍ය කාර්යාලයේ ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවූ පසු , වාර තුනකදී ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් නොකරන්නේ නම් ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් තාවකාලිකව ඉවත් කරනු ලැබේ. තවද පසුගිය අලුත්වැඩියාවන් සලකා බලා නැවත සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයේ ඇතුළත් කිරීමේ බලය අග්‍රාමාත්‍ය කාර්යාලය සතු බව.
7. අග්‍රාමාත්‍ය කාර්යාලයේ ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන නමුත්, අලුත්වැඩියා කටයුතු සිදුකිරීමේදී යම් වංචා සහගත ක්‍රියාවක හෝ යම් අක්‍රමිකතාවක යෙදුනු බවට හැඟී යන්නේ නම්, එවැනි සැපයුම්කරුවන් අසාදු ලේඛන ගතකර සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් නම ඉවත්කිරීමේ සම්පූර්ණ බලය අග්‍රාමාත්‍ය කාර්යාලය සතු බව.
8. ඔබ ආයතනය එකතුකළ අගය මත බදු (වැට්) සඳහා ලියාපදිංචි ආයතනයක් නම් ඒ වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ සහතිකය ඉදිරිපත් කිරීම.
9. අධි ආරක්ෂිත රථ අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සහ විශේෂ පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් වීම.
10. එක් එක් සේවා අයිතමය සඳහා ප්‍රවීණත්වයක් තිබීම සහ ඊට අදාල විශේෂිත උපකරණ සතුවිය යුතුය.
11. වාහන ටින්කරින් සහ පින්තාරු කිරීම සඳහා Paint Booth පැවතීම අනිවාර්යය අවශ්‍යතාවයකි.
12. වාහන අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා වාහන ඔසවන (Jack) තිබිය යුතුය.
13. නවීන වාහන අලුත්වැඩියා කිරීම සඳහා වාහන Scan කිරීමේ පහසුකම් තිබිය යුතුය.
14. අලුත්වැඩියාව සඳහා ගතවන කාලය මිල ගණන් ලබාදීමේ දී සටහන් කලයුතු අතර ඒම එකඟ වන කාලසීමාව තුළ වාහනය නියමිත පරිදි අලුත්වැඩියා කර නැවත භාරදීමට කටයුතු සිදුකළ යුතුය.යම් හෙයකින් ඊට වැඩි කාලයක් ගතවන්නේ නම් දීර්ඝ වන කාලය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් අවසර ලබා ගත යුතුය. එසේ නොමැති නම් එකඟ වූ කාල සීමාවට වැඩිවන සෑම දිනකටම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රමාද ගාස්තු අයකරනු ලැබේ.

ඇමුණුම **02**

<u>අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය පරීක්ෂාකිරීමේදී සලකා බලනු ලබන සාධක</u>

1. Professionalism / Experience & qualification of technicians
2. Satisfaction of previous attended repairs
3. Possessing of advance machineries /equipment
4. Firefighting capabilities
5. Safety hazards/accident preventive measures
6. Quality / Standard of tools
7. Security arrangement of vehicles in repairs
8. Availability of scanning facility (Only for engine repairs)
9. Availability of sufficient shelter and space
10. Availability of paint booth (Tinkering and Painting repairs only)
11. Availability of lifting facilities (Only for mechanical repairs)
12. Disposal of used spares /oil etc.